# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 54 දරන රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගම් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1973 දෙසැම්බර් මස 11 වන දින]

---

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 දෙසැම්බර් මස 21 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 54 දරන රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 දෙසැම්බර් මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 5/70.

**රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගම් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.** 283 වන අධිකාරය X වන කාණ්ඩය

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 54 දරන රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගම් (සංශෝධිත) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

**2.** මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගම් ආඥා පනතේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:— — 283 වන අධිකාරයේ 3 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"පොදු පරමාර්ථ.

3. සකසුරුවම්කම වැඩි දියුණු කිරීම, රෝගී හෝ ආපදා අවස්ථාවන්හිදී සාමාජිකයන්ට සහනය සැලසීම, මුදල් දුෂ්කරතාවන්හිදී ඔවුන්ට ආධාර කිරීම හා ඔවුන්ගේ ස්වාමිපුරුෂයන්/භාර්යාවන්, සුජාත දරුවන්, දරුකමට හදා ගැනීමේ ආඥා පනත ප්‍රකාර දරුකමට හදාගැනීමේ ආඥා කරනු ලැබ ඇති දරුවන් සහ එකී යම් සුජාත දරුවකුගේ හෝ දරුකමට හදා ගත් දරුවකුගේ සුජාත දරුවන්, සාමාජිකයන්ගේ පියවරුන්, මව්වරුන්, සහෝදරයන්, සහෝදරියන්, ඥාති පුත්‍රයන් හා ඥාති දියනියන් වෙනුවෙන් ප්‍රතිපාදන සැලැස්වීම සංස්ථාව පිහිටුවීමේ පොදු පරමාර්ථ වශයෙන් මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.".

**3.** 1966 අංක 15 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:— — ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) සංස්ථාවේ කටයුතු මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලබන පරිදි සාදනු ලබන පිතිවලට යටත්ව—

(අ) සංගමයේ සාමාජිකයකු වූත් ශ්‍රී ලංකා සිවිල් ලැයිස්තු වෙහි නම දැක්වෙන නිලධරයකුගේ තත්ත්වයට අඩු නොවූත් කොළඹ මහා නගර සභා ප්‍රදේශයේ පරිපාලන සීමා තුළ සේවාස්ථාන ගත කරනු ලැබ සිටින්නාවූ හා භාණ්ඩාගාරයේ ලේකම් විසින් සභාපති ලෙස පත් කරනු ලබන්නාවූත් රාජ්‍ය නිලධරයකුගෙන්,

1—ඒ 02208—9,297 (73/10)

(ආ) සංගමයේ සාමාජිකයන් වූත් ශ්‍රී ලංකා සිවිල් ලැයිස්තුවෙහි නම් දැක්වෙන නිලධරයන්ගේ තත්ත්වයට අඩු නොවූත් කොළඹ මහා නගර සභා ප්‍රදේශයේ පරිපාලන සීමා තුළ සේවාස්ථාන ගත කරනු ලැබ සිටින්නාවූ හා භාණ්ඩාගාරයේ ලේකම් විසින් නම් කරනු ලබන්නා වූත් රාජ්‍ය නිලධරයන් දෙදෙනකුගෙන් හා

(ඇ) සේවයෙහි සිටින් නම් කොළඹ මහා නගර සභා ප්‍රදේශයේ පරිපාලන සීමා තුළ සේවාස්ථාන ගත කරනු ලැබ සිටින නිලධරයන් විය යුතු බවට වූ අතුරු වගන්තියට යටත් ව වර්ෂයකට වරක් වාර්ෂික මහා සභා රැස්වීමේදී තෝරා ගනු ලබන සංස්ථාවේ සාමාජිකයන් එකොළොස් දෙනකු ගෙන් ද

සමන්විත පාලක කාරක සභාවක් විසින් පරිපාලනය කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** 1966 අංක 15 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (1) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ :—

"(1) සංගමයේ සාමාජිකයකු වූත් ශ්‍රී ලංකා සිවිල් ලැයිස්තුවෙහි නම දැක්වෙන නිලධරයකුගේ තත්ත්වයට අඩු නොවූත් කොළඹ මහා නගර සභා ප්‍රදේශයේ පරිපාලන සීමා තුළ සේවාස්ථාන ගත කරනු ලැබ සිටින්නාවූ හා භාණ්ඩාගාරයේ ලේකම් විසින් පත් කරනු ලබන්නාවූත් රාජ්‍ය නිලධරයකු එකී සංස්ථාවේ සභා කාරක සභාවේ සභාපතිවරයා විය යුතු අතර යම් රැස්වීමකට ඔහු නොපැමිණිය හොත් පැමිණ සිටින සාමාජිකයන් විසින් ඒ අවස්ථාව සඳහා සභාපතිවරයකු තෝරා පත් කර ගත යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"පුරප්පාඩු පිරවිය යුතු ක්‍රමය.

11. සභාපතිවරයා හෝ නම් කරනු ලැබූ සාමාජිකයන් දෙදෙනාගෙන් කෙනකු හෝ නොවන පාලක කාරක සභාවේ යම් සාමාජිකයකු මියගිය විට, ඉල්ලා අස්වූ විට, (සේවයෙහි සිටී නම්) කොළඹ මහා නගර සභා ප්‍රදේශයේ පරිපාලන සීමාවලින් පිටතට මාරු කරනු ලැබූ විට, 4 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ධුරය හිස් කළ විට හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර ව ගිය විට නැත හොත් පාලක කාරක සභාවේ ඒ සාමාජිකයා සංස්ථාවේ සාමාජිකයකු ව සිටීම මෙහි මින් මතු

විධිවිධාන සලස්වනු ලබන පරිදි සාදනු ලබන රීති යටතේ අවසන් වුවහොත් පාලක කාරක සභාවේ ඉතිරිව සිටින සාමාජිකයන් විසින් ඔහුගේ අනුප්‍රාප්තිකයා වශයෙන් සංස්ථාවේ කවර සාමාජිකයකු වුවද තෝරා පත් කර ගැනීම නීත්‍යානුකූල විය යුතු අතර එසේ තෝරා පත්කර ගනු ලැබූ සාමාජිකයා ඔහු තෝරා පත් කර ගැනීමෙන් අනතුරුව එළඹෙන සංස්ථාවේ ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වෙන තෙක් නොකඩවා එම ධුරය දැරිය යුතු ය:

එසේ වුවද එසේ තෝරා පත් කර ගනු ලැබූ සාමාජිකයා, සේවයෙහි සිටී නම්, කොළඹ මහා නගර සභා ප්‍රදේශයේ පරිපාලන සීමා තුළ සේවා ස්ථාන ගත කළ යුතුය. ".

**6.** 1966 අංක 15 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියෙහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ආ) (i) සේවකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ රෝගී අවස්ථා ද ඇතුළුව, ඔවුන්ගේ ආපදා අවස්ථාවල සහනය සැලසීම සඳහා,

(ii) ණය බේරීම සඳහා,

(iii) තාවකාලිකව මුදල් දුෂ්කරතාවලින් මිදීම සඳහා,

(iv) කාර්යාලයට හා කාර්යාලයෙන් දිනපතා ගමන් කිරීම පහසුවීම පිණිස බයිසිකල් සහ මෝටර් බයිසිකල් මිලට ගැනීම සඳහා:

එසේ වුවද තනි සේවකයකු සම්බන්ධයෙන් වූ විට එසේ දෙනු ලබන මුදල රුපියල් දෙසිය පනහ හෝ වාහනයේ මිල යන දෙකෙන් අඩු මුදලට වැඩි නොවිය යුතු ය, සහ

(v) උත්සව පැවැත්වීම සඳහා

ස්වකීය සේවකයන්ට ණය දීම නීත්‍යානුකූල විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. 1966 අංක 15 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියෙහි (4) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

"මේ වගන්තියෙන් පැවරුණු බලතල පිළිබඳ අර්ථවාචක ප්‍රකාශනය.

(4) සංස්ථාවේ කටයුතු පිළිබඳ කළමනාකරණය සඳහා හා එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා සංස්ථාවේ සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී රීති සාදනු ලැබීමට මේ වගන්තියෙන් සංස්ථාවට පැවරුණු බලතලවලට, එකී යම් සාමාජිකයකු මියගිය විට ඒ සාමාජිකයාගේ ස්වාමි පුරුෂයාට/භාර්යාවට හා සුජාත දරුවන්ට අයත් වන ප්‍රතිලාභ ඔහු විසින් නම් කරනු ලැබූ ඔවුන් ගෙන් යම් අයට පමණක් ගෙවිය හැකි බවට හෝ ඔහු විසින් නිශ්චිතව සඳහන් කොට තිබිය හැකි කොටස්වලින් ඔවුන් සියලු දෙනා අතර නැත හොත් ඔවුන්ගෙන් යම් අය අතර බෙදා දීම කළ හැකි බවට වූ විධිවිධාන අඩංගු රීති සෑදීමේ බලය ද ඇතුළත් වන ලෙස හා මේ ආඥාපනත ආරම්භ වීමේ සිට එසේ ඇතුළත් ව පවත්නා ලෙස සලකනු ලැබිය යුතු බව සැක දුරු කිරීම සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.".

සංශෝධන අතීතයට බලපෑම.

8. මේ පනතෙහි ඉහත දැක්වුණු විධිවිධාන මගින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි කරනු ලැබූ සංශෝධන 1973 ජනවාරි 1 වන දින වලංගු වූ ලෙස සියලු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය.